# 16

# වස්සානය

**රත්න ශ්‍රී විජේසිංහ (1953)**



1953 ජූනි මස දෙවැනි දින දකුණු පළාතේ නාකියාදෙණිය තෙල්ලඹුරේ ග්‍රාමයේ දී රත්න ශ්‍රී විජේසිංහ උපන්නේ ය. ඔහු ප්‍රාථමික අධ්‍යාපනය ලැබුයේ නාවල රජයේ පාසල, තෙල්ලඹුර විද්‍යාකාන්ති විදුහල හා තෙල්ලඹුර දුටුගැමුණු විදුහල යන පාසල්වලිනි. පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්වය සමත්වූ රත්න ශ්‍රී, ද්විතීයික අධ්‍යාපනය සඳහා හික්කඩුවේ ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළු විය. ඉනික්බිති ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙන් උසස් පෙළ තෙක් විද්‍යා අංශයෙන් උගත් හෙතෙම පසුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සිංහල විෂය පිළිබඳ ගෞරව උපාධිය ලබා ගත්තේ ය. කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිධරයකු ද වන රත්න ශ්‍රී සිය වෘත්තීය ජීවිතය අරඹන්නේ ගුරුවරයකු ලෙසිනි. පසු කලෙක දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිංහල භාෂා ඒකකය භාර ව කටයුතු කළ ඔහු අනතුරුව උණවටුන අමරසූරිය ගුරු විද්‍යාලයේ කථිකාචාර්යවරයකු ලෙස ද සේවය කළේය. එමෙන් ම ඔහු අමාත්‍යාංශ කිහිපයක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරු දරා ඇත.

පුවත්පත් කවි පිටු ගණනාවක් සංස්කරණයෙහි යෙදෙමින් ආධුනික කවීන්ට ගුරු උපදේශ හා ධෛර්යය සපයන රත්න ශ්‍රී රූපවාහිනී හා ගුවන්විදුලි වැඩසටහන් සම්පාදකයකු ලෙස ද පරිචයක් ලැබී ය. තීරු ලිපි රචනයෙන් සහ විශේෂාංග ලිපි සම්පාදනයෙන් රත්න ශ්‍රී පුවත්පත් කලාවට ද විශේෂ දායකත්වයක් සපයයි.

මේ සියලු සාහිත්‍ය කර්තව්‍යයන් අතරේ රත්න ශ්‍රී විජේසිංහයන් වඩාත් ම ජනප්‍රිය වූයේ කාව්‍ය හා ගී පද රචනයෙනි. 1975 දී පළ කළ **බිය නොවන් අයියණ්ඩි** ඔහුගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහයයි. පසුව පාඨක විචාරක නොමඳ අවධානය දිනූ **වස්සානේ** කාව්‍ය කෘතිය පළ විය. **සුබ උදෑසන** (රාජ්‍ය සම්මාන) **සල් ගහ යට**, **තරු ලකුණ**, **මධ්‍යම යාමය**, ඔහුගේ අනෙකුත් කාව්‍ය කෘති අතර වේ. රත්න ශ්‍රීගේ ගීත සංග්‍රහයන් වශයෙන් **වංකගිරි අරණේ** (රාජ්‍ය සම්මාන) **සුදු නෙළුම** (රාජ්‍ය සම්මාන), **ගංගා ගීතය**, **ඉර බටු තරුව**, **නෙත නිලුපුල්** (රාජ්‍ය සම්මාන), **ආලකමන්දා** (රාජ්‍ය සම්මාන) යන කෘති හඳුන්වා දිය හැකි ය. **සැළලිහිණියෝ**, **රන්කිරිකට**, **රතු කිකිළි**, **සින්දු කියන උණ පඳුර** (රාජ්‍ය සම්මාන) යන කෘති ඔහුගේ ළමා කෘති අතර වේ. **ලස්සනම අහස හා මතක සිතුවිලි**, **කටුගහයට**, **ලියවැල**, **අත් පසුර** යන ලිපි සංග්‍රහයන් හා **මහගම සේකර හා සමාජ යථාර්ථය** (මහාචාර්ය සුචරිත ගම්ලත් සමග) විමර්ශන කෘතිය රත්න ශ්‍රීගේ ලේඛන කාර්යයන් අතර වේ.

"මගේ බිසව්නේ අසාපන්", "කිරුළ මුතු ලිහී", "චන්ද්‍ර මණ්ඩලේ සැතපුණ පුංචි සාවියේ", "බිම්බරක් සෙනග ගැවසුන", "ලෙන්චිනා මගේ නංගියේ", වැනි ජනප්‍රිය ගී සිය ගණනක් රත්න ශ්‍රී ලියා ඇත. රත්න ශ්‍රී විජේසිංහ සාහිත්‍යධරයාගේ නිර්මාණ මෙහෙවර විමර්ශනය කරමින් රචිත විද්වත් ලිපි රැසකින් සමන්විත **රත්න ශ්‍රී නවකවියේ චන්ද්‍රෝදය** කෘතිය ඔහුගේ නිර්මාණ දිවිය පිළිබඳ මාහැඟි විවරණයකි. රාජ්‍ය සම්මාන රැසකින් පිදුම් ලත් මෙම නිර්මාණකරුවා ජපන් "බුන්කා" සම්මානයෙන් ද ඇගයීමට ලක් කෙරිණි. අද දවසේත් රත්න ශ්‍රී විජේසිංහ සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ පෝෂණයට නිබඳ ව දායක වෙමින් සිටියි.

රත්න ශ්‍රී විජේසිංහයන්ගේ වස්සානේ කාව්‍ය කෘතියෙහි එන 'වස්සානය' පද්‍ය පන්තිය නිර්මාණය වූයේ ඔහු ගුරුවරයකු ලෙස මොනරාගල දිස්ත්‍රික්කයේ හුලංදා ඔය සමීපයේ ජීවත් වූ කාලයේ ය. එම පරිසරය ද ජන ජීවිතය ද මැනවින් අත්විඳි කවියා එමගින් නිර්මාණ රැසක් ජාතියට දායාද කළේ ය. 'වස්සානය' පද්‍ය නිර්මාණය ජීවන දර්ශනයක් කැටිකරගත් අපූර්ව පරිසර චිත්‍රණයක් ද වෙයි.

ඔය දෑල දොඩමලු ය, සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම් ද?
කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන
සොඳුර, නුඹ වාගේ ම හිනැහේය මා එක්ක

කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට
දිය කෙළින හැටි පුංචි මාළුවෝ දුටුවා ද?
පුර පසේ සඳ එක්ක තරගයට මෝරන්ට
හුලංදා ඔය කිම් ද මල්වර ව ඉල්මහට?

සෙනේහය පිරී ගිය ඔබෙ නයන නිල් පොකුණ
දිය නිලන වැසි සමේ රැලි නගා උතුරා ය
තඹර පෙති අතර හෙල්මැලි රේණු වැසි වසින
ඔබෙ සිනාවෙන් නිවේ හුණු ව ගිය ලේ නහර

දෙවැට දිග කරඳවැල් ආරුක්කු යට සැඟව
නිල් කුරුලු බිලිඳු නිදි, ඇහැරවන්නේ කුමට?
රැගෙන දෝතට පෙරා උණුහුමට හිරු එළිය
මිහිරි මවුකිරි වගේ පොවන්නෙමි නුඹලාට

රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන
සන්නාලියන් කොහොම ඇන්දා ද දේදුන්න?
වැහි වතුර ඉහිනවා නම් ඔවුන් විහිළුවට
කුරුල්ලෝ ඉගිල්ලී වරෙන් නුඹ මා ළඟට

වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින
දූන් ඒවි තැනි බිමට - සීතල යි මගෙ සිතට
වැසි සමේ රැ ඇඳේ සිහිනයක් වී ඉන්න
ඔබ එන්න - ඉතින් මගෙ හෙට දවස මට දෙන්න

ගිම්හානයේ ගිලන් වී කෘශ ව සුදුමැලි ව
ඇදි ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන් ය
දුෂ්කර ය කියා හැර යා යුතු ද ජීවිතය?
කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස

## අභ්‍යාස

01. පහත සඳහන් යෙදුම්වල අදහස් පැහැදිලි කරන්න.

"කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩා ගෙන"
"කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට"
"රමණීය වන ගැබේ මොනරුන්ට පිල් වියන"
"වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින"
"කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස"

02. අපූර්ව කාව්‍යෝක්ති නිර්මාණයෙහිලා කවියා දක්වන සමත්කම උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

03. පරිසරයේ ජීව අජීව වස්තූන් කෙරෙහි වස්සාන සමයෙහි බලපෑම කවියා වර්ණනයට හසු කරන අයුරු විස්තර කරන්න.

04. අජීව වස්තූන් සජීවකරණයේ දී කවියා භාවිත කරන උපක්‍රම සාකච්ඡා කරන්න.

05. මෙම කවි පෙළෙන් දැක්වෙන ජීවන දෘෂ්ටිය පැහැදිලි කරන්න.

06. "වස්සානය කාව්‍ය පන්තිය චමත්කාර ජනක පරිසර වර්ණනයකි." මේ කියමන සාකච්ඡා කරන්න.